Department of Education – NWP Department of Education – NWP Department of Education - NWP Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මහව අධ්‍යාපන කලාපය

| 61 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - 2026
General Certificate Examination (Ordinary Level) Examination - 2026

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

පෙරහුරු සම්මන්ත්‍රණය

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three Hours

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## භූගෝල විද්‍යාව - I

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු** ම ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ** ම පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

1. භූ ලක්ෂණ සිතියමක ජාතික ඛණ්ඩාංක රේඛා ...................................................... වර්ණයෙන් ඇඳ ඇත.
   (රතු / නිල් / කළු)

2. ලෝක ජන සංඛ්‍යාවෙන් ...................................................... ක් පමණ ද්විතීයික ජන සංකේන්ද්‍රණ ආශ්‍රිත ව වාසය කරයි.
   (35% / 64% / 80%)

3. පෘථිවි ප්‍රාවරණයේ ඉහළ කොටසේ ...................................................... හා සිලිකේට් සංයෝග බහුල ව දක්නට ලැබේ.
   (ඔලිවීන් / මැග්නීසියම් / සින්ක්)

4. ...................................................... ශ්‍රී ලංකාවේ මැදරට තේ වගා කරන දිස්ත්‍රික්කයකි.
   (බදුල්ල / නුවරඑළිය / කෑගල්ල)

5. ඔස්ට්‍රේලියාවේ ...................................................... ප්‍රදේශය කපු වගාව සඳහා ප්‍රසිද්ධ ය.
   (පර්ත් / ඩාර්වින් / නිව් කාසල්)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **'නි'** යන්න වටා ද, වැරදි නම් **'වැ'** යන්න වටා ද රවුමක් අඳින්න.

6. බලංගොඩ ප්‍රදේශයේ සර්කෝන් ඛනිජය ව්‍යාප්ත ව ඇත. නි / වැ
7. නිවර්තන දේශගුණ කලාපය තුළ පැහැදිලි ඍතු හතරක් දක්නට ලැබේ. නි / වැ
8. හෙන්රි වික්හැම් විසින් මෙරට රබර් වගාව ආරම්භ කරන ලදි. නි / වැ
9. මෙසෝගෝලයේ ඉහළ සීමාව කි.මී. 80 ක් පමණ වේ. නි / වැ
10. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම් සඳහා වැඩි ම දායකත්වය සපයන්නේ කෘෂිකාර්මික අංශය යි. නි / වැ

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11. සුපීරියර් විල ........................................................ මහාද්වීපයේ පිහිටා ඇත.
12. ශ්‍රී ලංකාවේ වැඩි ම ව්‍යාප්තියක් සහිත පස් වර්ගය වන්නේ ........................................................ පස යි.
13. ජන සංඛ්‍යාවක් උපතින් ම උරුම කර ගන්නා ........................................................ හා පුමිතිරි බව වැනි ලක්ෂණ ජන සංඛ්‍යාවක ව්‍යුහාත්මක ලක්ෂණ ලෙස හැඳින්වේ.
14. ගං මෝය හා කලපු ........................................................ ධීවර කර්මාන්තය සඳහා වැදගත් වේ.
15. වර්තමානය වන විට නැව් තැනීමේ කර්මාන්තයේ ප්‍රමුඛ රට ........................................................ යි.
16. ඓන්ද්‍රීය ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් ........................................................ මහලෙහි අඩංගු වේ.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන යොදා ගන්න.

<u>ශ්‍රී ලංකාවට පැමිණි මාසික සංචාරකයන් සංඛ්‍යාව (2023-2024)</u>




මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)

17. 2023 වර්ෂයේ සංචාරක පැමිණීම 200,000 ඉක්මවා ඇත්තේ ............................................... මාසයේ ය.
18. වර්ෂ දෙකේ ම අඩු ම සංචාරක පැමිණීමක් වාර්තා වී ඇත්තේ ............................................... මාසයේ ය.
19. 2023 හා 2024 වර්ෂ අතර සංචාරක පැමිණීම්වල වැඩිම වෙනස දක්නට ලැබෙන්නේ ............................................... මාසයේ ය.

- අංක **20** සිට **25** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරු අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

20.

| **'අ'** වගාව | **'ආ'** යෝග්‍ය පස |
|---|---|
| 1. තේ | A. වර්නෝසම් |
| 2. රබර් | B. දියළු |
| 3. වී | C. ලෝම හා ලැටරයිට් |
| | D. ලැටරයිට් හා කබොක් |

(1) A, C, D (2) B, D, A (3) C, D, B (4) D, B, A (........)



Past Papers Wiki

21.

| ‘අ’ ගංගාව | ‘ආ’ ගලා බසින මුහුද |
|---|---|
| 1. මිසිසිපි | A. කැරිබියන් |
| 2. ඩැනියුබ් | B. මධ්‍යධරණී |
| 3. ඉන්දු | C. කළු |
| | D. අරාබි |

(1) A, B, C (2) A, C, D (3) B, A, C (4) D, B, A (........)

22.

| ‘අ’ සුළු අපනයන බෝගය | ‘ආ’ ව්‍යාප්ත ප්‍රදේශය |
|---|---|
| 1. කජු | A. මන්නාරම |
| 2. පැඟිරි | B. ගම්පහ |
| 3. කෝපි | C. නුවරඑළිය |
| | D. හම්බන්තොට |

(1) A, B, D (2) B, D, C (3) C, B, A (4) D, A, B (........)

23.

| ‘අ’ ලක්ෂණය | ‘ආ’ අයත් වන ශීර්ෂය |
|---|---|
| 1. දියමංකඩ | A. භූ විෂමතාව |
| 2. වාරි ඇල | B. මංමාවත් |
| 3. සම ගැඹුරු රේඛාව | C. ජලවහනය |
| | D. වෙනත් ලක්ෂණ |

(1) A, D, B (2) B, C, A (3) C, D, B (4) D, A, C (........)

24.

| ‘අ’ වන ජීවී රක්ෂිත වර්ගය | ‘ආ’ ප්‍රදේශය |
|---|---|
| 1. අභය භූමි | A. ත්‍රිකෝණ මඩු |
| 2. වන රක්ෂිත | B. හෝර්ටන් තැන්න |
| 3. ජාතික උද්‍යාන | C. නකල්ස් |
| | D. විල්පත්තු |

(1) A, B, C (2) B, C, D (3) C, D, A (4) D, C, B (........)

25.

| ‘අ’ රට | ‘ආ’ යමහල |
|---|---|
| 1. අයිස්ලන්තය | A. පැරකුටීන් |
| 2. ඉන්දුනීසියාව | B. කට්මායි |
| 3. මෙක්සිකෝව | C. හෙක්ලා |
| | D. ඩෙම්පෝ |

(1) A, D, B (2) B, D, C (3) C, D, A (4) D, A, B (........)

- අංක **26** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

26. කෘෂිකාර්මික අමුද්‍රව්‍ය පාදක කර්මාන්තයකි.
(1). ප්ලාස්ටික් (2). ටයර් (3). පැන්සල් කූරු (4). වීදුරු (........)

27. පුනර්ජනනීය ස්වාභාවික සම්පතකි.
(1). ජලය (2). පාෂාණ (3). වනාන්තර (4). මැණික් (........)

28. දේශගුණික සම්භවයක් ඇති උපද්‍රවයක් දැක්වෙන වරණය තෝරන්න.
(........)

PAST PAPERS WIKI

(1). නියඟ (2). සුනාමි (3). වසංගත රෝග (4). ගිනිකඳු

29. සංවර්ධනය මැනීම සඳහා භාවිත කළ පැරණි මිනුමක් වන්නේ,
    (1). මානුෂ සංවර්ධන දර්ශකය යි. (2). භෞතික ජීවන තත්ත්ව දර්ශකය යි.
    (3). මානුෂ දරිද්‍රතා දර්ශකය යි. (4). මූර්ත දළ ජාතික නිෂ්පාදිතය යි. (........)

30. සමනල කන්ද, පිදුරුතලාගල වැනි ප්‍රදේශවල දක්නට ලැබෙන වනාන්තර වර්ගය මින් කුමක් ද?
    (1). කඳුකර වියළි කලාපීය වනාන්තර (2). කඳුකර තෙත් කලාපීය වනාන්තර
    (3). නිවර්තන තෙත් වනාන්තර (4). අතරමැදි සදාහරිත වනාන්තර (........)

31. නවතම ජන සංගණන දත්ත අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වැඩි ම දිස්ත්‍රික්කය කුමක් ද?
    (1). මහනුවර (2). කොළඹ (3). ගම්පහ (4). කළුතර (........)

32. කොටු දැලක ආකාරයෙන්, සෘජුකෝණික රටාවකට ගංගා හා අතු ගංගාවන් ගලා යාම හඳුන්වනු ලබන්නේ,
    (1). ශාඛීය ජලවහන රටාව ලෙස ය. (2). වලයාකාර ජලවහන රටාව ලෙස ය.
    (3). අරීය ජලවහන රටාව ලෙස ය. (4). ජාලාකාර ජලවහන රටාව ලෙස ය. (........)

33. පෘථිවි වායුගෝලය තුළ 1% කට ආසන්න වායු පරිමාවක් අයත් වන වායු වර්ග දෙක දැක්වෙන වරණය තෝරන්න.
    (1). ආගන් හා කාබන්ඩයොක්සයිඩ් (2). ඔක්සිජන් හා ආගන්
    (3). කාබන්ඩයොක්සයිඩ් හා ඕසෝන් (4). ඕසෝන් හා හීලියම් (........)

34. විද්‍යුත් කර්මාන්තය ආශ්‍රිත සුවිශේෂී ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
    (1). පරිසර හිතකාමී නිෂ්පාදනයන් වීම
    (2). නිෂ්පාදන සඳහා වැය කරන මුදල මෙන් දෙගුණයක් පර්යේෂණ සඳහා වැය වීම
    (3). පාරම්පරික දැනුම හා නවීන තාක්ෂණය භාවිතයෙන් නිෂ්පාදන සිදු කිරීම
    (4). ඇණවුම් මත නිෂ්පාදන සිදු කිරීම (........)

35. ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උද්‍යානයක් පිහිටා ඇති ස්ථානයකි.
    (1). කනන්විල (2). මාතලේ (3). මීවනපලාන (4). බටඅත (........)

36. ශ්‍රී ලංකාවට බලපාන සුළි සුළං බහුලව ම ඇතිවන කාල සීමාව වන්නේ,
    (1). මාර්තු සිට අප්‍රේල් ය. (2). මැයි සිට සැප්තැම්බර් ය.
    (3). ඔක්තෝබර් සිට දෙසැම්බර් ය. (4). නොවැම්බර් සිට පෙබරවාරි ය. (........)

37. බෝර්නියෝ දූපත අයත් වන භූ තැටිය වන්නේ මින් කුමක් ද?
    (1). යුරේසියානු (3). අප්‍රිකානු (2). ඉන්දු-ඕස්ට්‍රේලියානු (4). පැසිෆික් (........)

- පහත **A, B, C** හා **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. උපත් අනුපාතය
    2. වියපත් දර්ශකය

B - 1. යෙදවුම් මිල
    2. නිෂ්පාදන වියදම

C - 1. වසංගත රෝග
    2. සිවිල් යුද්ධ

D - 1. වායු පීඩනය
    2. උන්නතාංශය

38. පළමුවැන්නේ පහළ යාම දෙවැන්න ඉහළ යාමට හේතු වන ප්‍රකාශ යුගලය මින් කුමක් ද?
    (1). A (2). B (3). C (4). D (........)

39. දෙවැන්න වැඩි වන විට පළමුවැන්න අඩු වන මාතෘකා යුගලය කුමක් ද?
    (1). A (2). B (3). C (4). D (........)

40. පළමුවැන්න වැඩි වන විට දෙවැන්න ද වැඩි වන, පළමුවැන්න අඩු වන විට දෙවැන්න ද අඩු වන මාතෘකා යුගලය මින් කුමක් ද?
    (1). A (2). B (3). C (4). D (........)

❋❋❋❋

Department of Education – NWP Department of Education – NWP Department of Education - NWP Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**මහව අධ්‍යාපන කලාපය**

| 61 | S | I, II |
|---|---|---|

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026**
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - 2026
General Certificate Examination (Ordinary Level) Examination - 2026

**භූගෝල විද්‍යාව - II**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

## I කොටස

01. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් ප්‍රශ්නවලට පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. අංක ① න් දැක්වෙන වගාව කුමක් ද?
(රබර් / තේ / වෙනත් වැවිලි) (ලකුණු 01 යි)

ii. අංක ② චතුරස්‍රය තුළ දක්නට ලැබෙන ජලවහන රටාව කුමක් ද?
(අරීය / ශාඛීය / ජාලාකාර) (ලකුණු 01 යි)

iii. අංක ③ න් දක්වා ඇති වෘක්ෂලතා වර්ගය කුමක් ද?
(වගුරු බිම / තණබිම / කඩොලාන) (ලකුණු 01 යි)

iv. අංක ④ න් දැක්වෙන මායිම කුමක් ද?
(නගර සභා / අභයභූමි / පළාත්) (ලකුණු 01 යි)

v. A - A ලක්ෂණයෙන් දැක්වෙනුයේ කුමක් ද?
(කපොල්ල / නිම්නය / නෙරුව) (ලකුණු 01 යි)

vi. අංක ⑤ චතුරස්‍රය තුළ සංකේත මගින් නිරූපිත පොදු සේවා සපයන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

vii. අංක ⑥ න් දැක්වෙන්නේ කුමක් ද? (ලකුණු 01 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (viii) හා (ix) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් **'නි'** යන්න ද, වැරදි නම් **'වැ'** යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ **ප්‍රශ්න අංක ඉදිරියෙන් ලියා දක්වන්න.**

viii. වී වගා බිම් වැඩි ප්‍රමාණයක් ව්‍යාප්ත ව ඇත්තේ වැව් ආශ්‍රිත ව ය. (ලකුණු 01 යි)

ix. අංක ⑦න් දැක්වෙන්නේ අක්ෂාංශ හා දේශාංශ එකිනෙක හමුවන ස්ථානයකි. (ලකුණු 01 යි)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත **කොටුව තුළ** ලියා දක්වන්න.

  i. නේපාලය - Ⓐ, Ⓑ, Ⓒ
  ii. කොංගෝ ගඟ - Ⓕ, Ⓖ, Ⓗ
  iii. ඇපලේචියන් කඳු - Ⓙ, Ⓚ, Ⓛ
  iv. තායිවානය - Ⓜ, Ⓝ, Ⓟ
  v. බෝෆට් මුහුද - Ⓠ, Ⓡ, Ⓢ (ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත **කොටුව තුළ** ලියා දක්වන්න.

  i. මුලතිව් දිස්ත්‍රික්කය - Ⓐ, Ⓑ, Ⓒ
  ii. බතලගොඩ - Ⓕ, Ⓖ, Ⓗ
  iii. බරුතකන්ද - Ⓙ, Ⓚ, Ⓛ
  iv. චුන්ඩිකුලම් - Ⓜ, Ⓝ, Ⓟ
  v. බෝගල - Ⓠ, Ⓡ, Ⓢ (ලකුණු 05 යි)

## II කොටස




02. (i). මෙම රූප සටහනෙහි A හා B නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). A කලාපය ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

03. (i). ලෝකයේ මිනිරන් නිපදවන ප්‍රධාන රටවල් අතර, ඇමරිකානු කලාපයට අයත් රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). පහත දැක්වෙන ප්‍රයෝජන ලබා ගන්නා පාෂාණ වර්ගය බැගින් නම් කරන්න.
(a). බලශක්තියක් වශයෙන් යොදා ගනියි
(b). ආභරණ සෑදීම සඳහා භාවිත කරයි
(c). මහා මාර්ග ඉදි කිරීමට යොදා ගනියි (ලකුණු 03 යි)

(iii). ඛනිජ සම්පත් උපයෝජනයේ දී මතුවන පාරිසරික ගැටලු **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

04. (i). ලෝකයේ ලැව්ගිනි බහුලව හට ගන්නා රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). මෙම සිතියමෙහි A, B හා C ලෙස නම් කර ඇති භූමිකම්පා කලාප නම් කරන්න. (ලකුණු 03 යි)

(iii). සුනාමි ආපදාවෙන් සිදු වන හානි අවම කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)




05. (i). පහත සඳහන් අධිවේගී මාර්ග කොටස් හඳුන්වනු ලබන්නේ කුමන නම්වලින් ද?

(a). මීරිගම - කුරුණෑගල

(b). කොට්ටාව - ගාල්ල (ලකුණු 02 යි)

(ii). ශ්‍රී ලංකාවෙ ඇති ජාත්‍යන්තර ගුවන් තොටුපලවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නගා සිටු වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

06. (i). ජපානය හැරුණු කොට මෝටර් රථ නිෂ්පාදනයේ ශීඝ්‍ර දියුණුවක් ලබා ඇති වෙනත් ආසියාතික රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). මෝටර් රථ කර්මාන්තයේ ශීඝ්‍ර දියුණුවට හේතු වූ කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii). වර්තමානයේ මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ දක්නට ලැබෙන ප්‍රවණතා **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

07. (i). කිරිපට්ටි පාලනයේ යෙදෙන

(a). යුරෝපා රටක්

(b). ආසියාතික රටක් බැගින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). කිරිපට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ දේශීය කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

08. (i). ජල චක්‍රය තුළ දක්නට ලැබෙන ක්‍රියාවලි **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). වායුගෝලය දූෂණය වීමෙන් මානුෂ පරිසරයට ඇතිවන බලපෑම් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii). ජෛවගෝලයේ පැවැත්ම කෙරෙහි බලපාන මානුෂ ක්‍රියාකාරකම් **තුනක්** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 05 යි)

❋ ❋ ❋ ❋

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026 පෙරහුරු සම්මන්ත්‍රණය
Department of Education – NWP Department of Education – NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## මහව අධ්‍යාපන කලාපය

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026**
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - 2026
General Certificate of Education (Ordinary Level) Examination - 2026

**පෙරහුරු සම්මන්ත්‍රණය**

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

විභාග අංකය:.....................................

1· (අ) / (அ) / (a)

i. ------------------------------------------------------------

ii. ------------------------------------------------------------

iii. ------------------------------------------------------------

iv. ------------------------------------------------------------

v. ------------------------------------------------------------

vi. ------------------------------------------------------------

------------------------------------------------------------

vii. ------------------------------------------------------------

viii. ------------------------------------------------------------

ix. ------------------------------------------------------------

10

Past Papers Wiki



(ආ) / (ஆ) / (b)




(i)

(ii)

(iii)

(iv)

(v)

5

(ඉ) / (இ) / (c)




(i)

(ii)

(iii)

(iv)

(v)

5

1. (අ) (அ) (a) $\frac{}{10}$ (ආ) (ஆ) (b) $\frac{}{5}$ (ඉ) (இ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**මහව අධ්‍යාපන කලාපය**

Department of Education – NWP Department of Education – NWP Department of Education - NWP

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026**
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - 2026
General Certificate Examination (Ordinary Level) Examination - 2026

**පෙරහුරු සම්මන්ත්‍රණය**




**1:50,000**

WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Department of Education – NWP Department of Education – NWP Department of Education - NWP Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**මහව අධ්‍යාපන කලාපය**

| 61 | S | I, II |
|---|---|---|

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026**

கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - 2026

General Certificate Examination (Ordinary Level) Examination - 2026

| | | |
|---|---|---|
| **භූගෝල විද්‍යාව I, II**<br>**புவியியல் I, II**<br>**Geography I, II** | **පෙරහුරු සම්මන්ත්‍රණය**<br>**පිළිතුරු පත්‍රය** | *පැය තුනයි*<br>*மூன்று மணித்தியாலம்*<br>*Three Hours* |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## භූගෝල විද්‍යාව - I

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.

* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු** ම ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ** ම පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

1. භූ ලක්ෂණ සිතියමක ජාතික බණ්ඩාංක රේඛා .......**නිල්**....... වර්ණයෙන් ඇඳ ඇත.
(රතු / නිල් / කළු)

2. ලෝක ජන සංඛ්‍යාවෙන් .......**80%**....... ක් පමණ ද්විතීයික ජන සංකේන්ද්‍රණ ආශ්‍රිත ව වාසය කරයි.
(35% / 64% / 80%)

3. පෘථිවි ප්‍රාවරණයේ ඉහළ කොටසේ .......**ඔලිවීන්**....... හා සිලිකේට් සංයෝග බහුල ව දක්නට ලැබේ.
(ඔලිවීන් / මැග්නීසියම් / සින්ක්)

4. .......**බදුල්ල**....... ශ්‍රී ලංකාවේ මැදරට තේ වගා කරන දිස්ත්‍රික්කයකි.
(බදුල්ල / නුවරඑළිය / කෑගල්ල)

5. ඔස්ට්‍රේලියාවේ .......**නිව් කාසල්**....... ප්‍රදේශය කපු වගාව සඳහා ප්‍රසිද්ධ ය.
(පර්ත් / ඩාර්වින් / නිව් කාසල්)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **'නි'** යන්න වටා ද, වැරදි නම් **'වැ'** යන්න වටා ද රවුමක් අඳින්න.

6. බලංගොඩ ප්‍රදේශයේ සර්කෝන් ඛනිජය ව්‍යාප්ත ව ඇත. **(නි)** / වැ
7. නිවර්තන දේශගුණ කලාපය තුළ පැහැදිලි ඍතු හතරක් දක්නට ලැබේ. නි / **(වැ)**
8. හෙන්රි වික්හැම් විසින් මෙරට රබර් වගාව ආරම්භ කරන ලදි. **(නි)** / වැ
9. මෙසෝගෝලයේ ඉහළ සීමාව කි.මී. 80 ක් පමණ වේ. **(නි)** / වැ
10. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම් සඳහා වැඩි ම දායකත්වය සපයන්නේ කෘෂිකාර්මික අංශය යි. නි / **(වැ)**

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11. සුපීරියර් විල ..........උතුරු ඇමරිකා.......... මහාද්වීපයේ පිහිටා ඇත.
12. ශ්‍රී ලංකාවේ වැඩි ම ව්‍යාප්තියක් සහිත පස් වර්ගය වන්නේ ..........රතු දුඹුරු.......... පස යි.
13. ජන සංඛ්‍යාවක් උපතින් ම උරුම කර ගන්නා ..........වයස් ව්‍යුහය..........හා පුමිතිරි බව වැනි ලක්ෂණ ජන සංඛ්‍යාවක ව්‍යුහාත්මක ලක්ෂණ ලෙස හැඳින්වේ.
14. ගං මෝය හා කලපු ..........කිවුල් දිය/දෙදිය.......... ධීවර කර්මාන්තය සඳහා වැදගත් වේ.
15. වර්තමානය වන විට නැව් තැනීමේ කර්මාන්තයේ ප්‍රමුඛ රට ..........දකුණු කොරියාව..........යි.
16. ජෛන්ද්‍රීය ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් ..........A.......... මහලෙහි අඩංගු වේ.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන යොදා ගන්න.




17. 2023 වර්ෂයේ සංචාරක පැමිණීම 200,000 ඉක්මවා ඇත්තේ ..........දෙසැම්බර්.......... මාසයේ ය.
18. වර්ෂ දෙකේ ම අඩු ම සංචාරක පැමිණීමක් වාර්තා වී ඇත්තේ ..........මැයි.......... මාසයේ ය.
19. 2023 හා 2024 වර්ෂ අතර සංචාරක පැමිණීම්වල වැඩිම වෙනස දක්නට ලැබෙන්නේ ..........පෙබරවාරි.......... මාසයේ ය.

- අංක **20** සිට **25** තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරු අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

20.

| 'අ' වගාව | 'ආ' යෝග්‍ය පස |
|---|---|
| 1. තේ | A. වර්නෝසම් |
| 2. රබර් | B. දියළු |
| 3. වී | C. ලෝම් හා ලැටරයිට් |
| | D. ලැටරයිට් හා කබොක් |

(1) A, C, D (2) B, D, A (3) C, D, B (4) D, B, A (...3...)

21.

| 'අ' | 'ආ' |
|---|---|
| **ගංගාව** | **ගලා බසින මුහුද** |
| 1. මිසිසිපි | A. කැරිබියන් |
| 2. ඩැනියුබ් | B. මධ්‍යධරණී |
| 3. ඉන්දු | C. කළු |
| | D. අරාබි |

(1) A, B, C (2) A, C, D (3) B, A, C (4) D, B, A (..2..)

22.

| 'අ' | 'ආ' |
|---|---|
| **සුළු අපනයන බෝගය** | **ව්‍යාප්ත ප්‍රදේශය** |
| 1. කජු | A. මන්නාරම |
| 2. පැඟිරි | B. ගම්පහ |
| 3. කෝපි | C. නුවරඑළිය |
| | D. හම්බන්තොට |

(1) A, B, D (2) B, D, C (3) C, B, A (4) D, A, B (..1..)

23.

| 'අ' | 'ආ' |
|---|---|
| **ලක්ෂණය** | **අයත් වන ශීර්ෂය** |
| 1. දියමංකඩ | A. භූ විෂමතාව |
| 2. වාරි ඇල | B. මංමාවත් |
| 3. සම ගැඹුරු රේඛාව | C. ජලවහනය |
| | D. වෙනත් ලක්ෂණ |

(1) A, D, B (2) B, C, A (3) C, D, B (4) D, A, C (..2..)

24.

| 'අ' | 'ආ' |
|---|---|
| **වන ජීවී රක්ෂිත වර්ගය** | **ප්‍රදේශය** |
| 1. අභය භූමි | A. ත්‍රිකෝණ මඩු |
| 2. වන රක්ෂිත | B. හෝර්ටන් තැන්න |
| 3. ජාතික උද්‍යාන | C. නකල්ස් |
| | D. විල්පත්තු |

(1) A, B, C (2) B, C, D (3) C, D, A (4) D, C, B (..4..)

25.

| 'අ' | 'ආ' |
|---|---|
| **රට** | **යමහල** |
| 1. අයිස්ලන්තය | A. පැරකුටීන් |
| 2. ඉන්දුනීසියාව | B. කට්මායි |
| 3. මෙක්සිකෝව | C. හෙක්ලා |
| | D. ඩෙම්පෝ |

(1) A, D, B (2) B, D, C (3) C, D, A (4) D, A, B (..3..)

PAST PAPERS WIKI

- අංක **26** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

26. කෘෂිකාර්මික අමුද්‍රව්‍ය පාදක කර්මාන්තයකි.
(1). ප්ලාස්ටික් (2). ටයර් (3). පැන්සල් කූරු (4). වීදුරු (..2..)

27. පුනර්ජනනීය ස්වාභාවික සම්පතකි.
(1). ජලය (2). පාෂාණ (3). වනාන්තර (4). මැණික් (..3..)

28. දේශගුණික සම්භවයක් ඇති උපද්‍රවයක් දැක්වෙන වරණය තෝරන්න.
(1). නියඟ (2). සුනාමි (3). වසංගත රෝග (4). ගිනිකඳු (..1..)

29. සංවර්ධනය මැනීම සඳහා භාවිත කළ පැරණි මිනුමක් වන්නේ,
(1). මානුෂ සංවර්ධන දර්ශකය යි. (2). භෞතික ජීවන තත්ත්ව දර්ශකය යි.
(3). මානුෂ දරිද්‍රතා දර්ශකය යි. (4). මූර්ත දළ ජාතික නිෂ්පාදිතය යි. (..4..)

30. සමනල කන්ද, පිදුරුතලාගල වැනි ප්‍රදේශවල දක්නට ලැබෙන වනාන්තර වර්ගය මින් කුමක් ද?
(1). කඳුකර වියළි කලාපීය වනාන්තර (2). කඳුකර තෙත් කලාපීය වනාන්තර
(3). නිවර්තන තෙත් වනාන්තර (4). අතරමැදි සදාහරිත වනාන්තර (..2..)

31. නවතම ජන සංගණන දත්ත අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වැඩි ම දිස්ත්‍රික්කය කුමක් ද?
(1). මහනුවර (2). කොළඹ (3). ගම්පහ (4). කළුතර (..3..)

32. කොටු දැලක ආකාරයෙන්, ඍජුකෝණික රටාවකට ගංගා හා අතු ගංගාවන් ගලා යාම හඳුන්වනු ලබන්නේ,
(1). ශාඛීය ජලවහන රටාව ලෙස ය. (2). වලයාකාර ජලවහන රටාව ලෙස ය.
(3). අරීය ජලවහන රටාව ලෙස ය. (4). ජාලාකාර ජලවහන රටාව ලෙස ය. (..4..)

33. පෘථිවි වායුගෝලය තුළ 1% කට ආසන්න වායු පරිමාවක් අයත් වන වායු වර්ග දෙක දැක්වෙන වරණය තෝරන්න.
(1). ආගන් හා කාබන්ඩයොක්සයිඩ් (2). ඔක්සිජන් හා ආගන්
(3). කාබන්ඩයොක්සයිඩ් හා ඕසෝන් (4). ඕසෝන් හා හීලියම් (..1..)

34. විද්‍යුත් කර්මාන්තය ආශ්‍රිත සුවිශේෂී ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1). පරිසර හිතකාමී නිෂ්පාදනයන් වීම
(2). නිෂ්පාදන සඳහා වැය කරන මුදල මෙන් දෙගුණයක් පර්යේෂණ සඳහා වැය වීම
(3). පාරම්පරික දැනුම හා නවීන තාක්ෂණය භාවිතයෙන් නිෂ්පාදන සිදු කිරීම
(4). ඇණවුම් මත නිෂ්පාදන සිදු කිරීම
(..2..)

35. ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උද්‍යානයක් පිහිටා ඇති ස්ථානයකි.
(1). කනන්විල (2). මාතලේ (3). මීවනපලාන (4). බටඅත (..4..)

36. ශ්‍රී ලංකාවට බලපාන සුළි සුළං බහුලව ම ඇතිවන කාල සීමාව වන්නේ,
(1). මාර්තු සිට අප්‍රේල් ය. (2). මැයි සිට සැප්තැම්බර් ය.
(3). ඔක්තෝබර් සිට දෙසැම්බර් ය. (4). නොවැම්බර් සිට පෙබරවාරි ය. (..3..)

37. බෝර්නියෝ දූපත අයත් වන භූ තැටිය වන්නේ මින් කුමක් ද?
(1). යුරේසියානු (3). අප්‍රිකානු (2). ඉන්දු-ඕස්ට්‍රේලියානු (4). පැසිෆික් (..1..)

- පහත **A, B, C** හා **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. උපත් අනුපාතය
2. වියපත් දර්ශකය

B - 1. යෙදවුම් මිල
2. නිෂ්පාදන වියදම

C - 1. වසංගත රෝග
2. සිවිල් යුද්ධ

D - 1. වායු පීඩනය
2. උන්නතාංශය

38. පළමුවැන්නේ පහළ යාම දෙවැන්න ඉහළ යාමට හේතු වන ප්‍රකාශ යුගලය මින් කුමක් ද?
(1). A (2). B (3). C (4). D (1/A)

39. දෙවැන්න වැඩි වන විට පළමුවැන්න අඩු වන මාතෘකා යුගලය කුමක් ද?
(1). A (2). B (3). C (4). D (4/D)

40. පළමුවැන්න වැඩි වන විට දෙවැන්න ද වැඩි වන, පළමුවැන්න අඩු වන විට දෙවැන්න ද අඩු වන මාතෘකා යුගලය මින් කුමක් ද?
(1). A (2). B (3). C (4). D (2/B)

❋❋❋❋

Department of Education – NWP Department of Education – NWP Department of Education - NWP Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| 61 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - 2026
General Certificate Examination (Ordinary Level) Examination - 2026

## භූගෝල විද්‍යාව - II

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* I කොටසේ **01** ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* **II** කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

## I කොටස

01. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් ප්‍රශ්නවලට පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. අංක ① න් දැක්වෙන වගාව කුමක් ද?
(රබර් / තේ / වෙනත් වැවිලි) (ලකුණු 01 යි)

ii. අංක ② චතුරශ්‍රය තුළ දක්නට ලැබෙන ජලවහන රටාව කුමක් ද?
(අරීය / ශාඛීය / ජාලාකාර) (ලකුණු 01 යි)

iii. අංක ③ න් දක්වා ඇති වෘක්ෂලතා වර්ගය කුමක් ද?
(වගුරු බිම / තණබිම / කඩොලාන) (ලකුණු 01 යි)

iv. අංක ④ න් දැක්වෙන මායිම කුමක් ද?
(නගර සභා / අභයභූමි / පළාත්) (ලකුණු 01 යි)

v. A - A ලක්ෂණයෙන් දැක්වෙනුයේ කුමක් ද?
(කපොල්ල / නිම්නය / නෙරුව) (ලකුණු 01 යි)

vi. අංක ⑤ චතුරශ්‍රය තුළ සංකේත මගින් නිරූපිත පොදු සේවා සපයන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

vii. අංක ⑥ න් දැක්වෙන්නේ කුමක් ද? (ලකුණු 01 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (viii) හා (ix) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් **'නි'** යන්න ද, වැරදි නම් **'වැ'** යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංක ඉදිරියෙන් **ලියා දක්වන්න.**

viii. වී වගා බිම් වැඩි ප්‍රමාණයක් ව්‍යාප්ත ව ඇත්තේ වැව් ආශ්‍රිත ව ය. (ලකුණු 01 යි)

ix. අංක ⑦න් දැක්වෙන්නේ අක්ෂාංශ හා දේශාංශ එකිනෙක හමුවන ස්ථානයකි. (ලකුණු 01 යි)

Department of Education – NWP Department of Education – NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department of Education - NWP Department

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026**
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - 2026
General Certificate of Education (Ordinary Level) Examination - 2026

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

විභාග අංකය:....................................

1· (අ) / (அ) / (a)

i. වෙනත් වැව්ලි — 1

ii. ශාඛීය — 1

iii. වගුරු බිම — 1

iv. අභයභූමි — 1

v. නිම්නය — 1

vi. රෝහල / උප තැපැල් කාර්යාලය / පාසල — 1

(මින් දෙකක්) — 1

vii. ඉදි කරන ප්‍රධාන මාර්ගය — 1

viii. නි — 1

ix. නි — 1

10/10

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

i. නේපාලය - Ⓐ, Ⓑ, Ⓒ
ii. කොංගෝ ගඟ - Ⓕ, Ⓖ, Ⓗ
iii. ඇපලේචියන් කඳු - Ⓙ, Ⓚ, Ⓛ
iv. තායිවානය - Ⓜ, Ⓝ, Ⓟ
v. බෝෆට් මුහුද - Ⓠ, Ⓡ, Ⓢ (ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

i. මුලතිව් දිස්ත්‍රික්කය - Ⓐ, Ⓑ, Ⓒ
ii. බතලගොඩ - Ⓕ, Ⓖ, Ⓗ
iii. බරුතකන්ද - Ⓙ, Ⓚ, Ⓛ
iv. චුන්ඩිකුලම් - Ⓜ, Ⓝ, Ⓟ
v. බෝගල - Ⓠ, Ⓡ, Ⓢ (ලකුණු 05 යි)

(ආ) / (ஆ) / (b)




N

(i) A

(ii) G

(iii) K

(iv) P

(v) Q

5/5

(ඇ) / (இ) / (c)




N

(i) B

(ii) F

(iii) L

(iv) M

(v) R

5/5

1. (අ) (அ) (a) $\frac{10}{10}$ (ආ) (அ) (b) $\frac{5}{5}$ (ඇ) (இ) (c) $\frac{5}{5}$ $= \frac{20}{20}$

## II කොටස

**02. (i). මෙම රූප සටහනෙහි A හා B නම් කරන්න.** **(ලකුණු 02 යි)**

- A - මහාද්වීපික තටකය
- B - ආගාධය




**(නිවැරදි ව නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)**

**(ii). A කලාපය ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් තුනක් දක්වන්න. (ලකුණු 03 යි)**

- ධීවර කර්මාන්තය
- ඛනිජ තෙල් හා ස්වාභාවික වායු නිධි සෙවීම හා නිෂ්පාදනය
- මුහුදු පත්ලෙන් ඛනිජ සම්පත් ලබා ගැනීම
- නාවික ප්‍රවාහනය හා වරාය ආශ්‍රිත කටයුතු
- ජල ජීවී වගාව (Aquaculture)
- සුළං බලශක්ති නිෂ්පාදනය
- ලුණු හා වෙනත් සාගර සම්පත් ලබා ගැනීම
- මුහුදු ආහාර හා සාගර ජීවී සම්පත් එකතු කිරීම
- වෙරළාශ්‍රිත සංචාරක කර්මාන්තය (කොරල්, මත්ස්‍යයින් නැරඹීම වැනි)
- සාගර විද්‍යාත්මක පර්යේෂණ
- මුහුදු යට සන්නිවේදන කේබල් හා නල මාර්ග ස්ථාපනය කිරීම

**(යනාදි මහාද්වීපික තටකය ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් තුනක් දක්වා ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)**

**(iii). ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 05 යි)**

- මිරිදිය ජලාශවලට මත්ස්‍ය පැටවුන් (මාළු පැටවුන්) මුදා හැරීම
- මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන හා මත්ස්‍ය බීජ නිෂ්පාදන මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම
- ධීවරයන්ට ධීවර ආම්පන්න හා උපකරණ ලබා දීම/සහන සැලසීම
- ධීවරයන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- මිරිදිය මත්ස්‍ය සම්පත ආරක්ෂා කිරීම සඳහා නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම
- ජලාශ හා මත්ස්‍ය සම්පත් සංරක්ෂණය කිරීම
- මිරිදිය ධීවරයන් සඳහා සහනදායී ණය හා මූල්‍ය පහසුකම් ලබා දීම
- මත්ස්‍ය සැකසුම් හා අලෙවි පහසුකම් වැඩිදියුණු කිරීම
- ජල ජීවී වගාව (Aquaculture) හා මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම
- මිරිදිය ධීවර කර්මාන්තය පිළිබඳ පර්යේෂණ හා නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම

**(යනාදි ක්‍රියාමාර්ග තුනක් දක්වා ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03**
**විස්තර කිරීමට ලකුණු 02**
**ලකුණු 05 යි)**

**03. (i). ලෝකයේ මිනිරන් නිපදවන ප්‍රධාන රටවල් අතර, ඇමරිකානු කලාපයට අයත් රටවල් දෙකක් නම් කරන්න.**

**(ලකුණු 02 යි)**

- බ්‍රසීලය
- මෙක්සිකෝව

**(නිවැරදි ව නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)**

**(ii). පහත දැක්වෙන ප්‍රයෝජන ලබා ගන්නා පාෂාණ වර්ගය බැගින් නම් කරන්න. (ලකුණු 03 යි)**

(a). බලශක්තියක් වශයෙන් යොදා ගනියි - ගල් අඟුරු (අවසාදිත පාෂාණ)

(b). ආභරණ සෑදීම සඳහා භාවිත කරයි - දියමන්ති/මැණික් (විපරීත පාෂාණ)

(c). මහා මාර්ග ඉදි කිරීමට යොදා ගනියි - ග්‍රැනයිට් (ආග්නේය පාෂාණ)

**(නිවැරදි ව නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)**

**(iii). ඛනිජ සම්පත් උපයෝජනයේ දී මතුවන පාරිසරික ගැටලු තුනක් කෙටියෙන් විස්තර කරන්න.**

**(ලකුණු 05 යි)**

- වනාන්තර විනාශය හා ජෛව විවිධත්වය අඩු වීම
- පාංශු ඛාදනය හා භූමි හායනය
- ජල දූෂණය
- වායු දූෂණය
- ශබ්ද දූෂණය
- භූ දර්ශනය වෙනස් වීම හා භූමි විනාශය
- ජලජ ජීවීන්ට හානි සිදුවීම
- විෂ සහිත අපද්‍රව්‍ය පරිසරයට එක්වීම
- හරිතාගාර වායු විමෝචනය හා ගෝලීය උණුසුම ඉහළ යාම
- විශාල වළවල් හා කැණීම් හේතුවෙන් භූමියේ ස්ථායිතාව අඩු වීම
- භූගත ජල මට්ටම පහළ යාම හා ජල සම්පත් අඩු වීම
- කර්මාන්ත හා පතල් අපද්‍රව්‍ය නිසා පරිසර දූෂණය

**(යනාදි පාරිසරික ගැටලු තුනක් දක්වා ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03**
**විස්තරයට ලකුණු 02**
**ලකුණු 05 යි)**

**04. (i). ලෝකයේ ලැව්ගිනි බහුලව හට ගන්නා රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)**

- කැනඩාව
- ඇමරිකා එක්සත් ජනපදය
- ප්‍රංශය
- චීනය
- ඉන්දුනීසියාව
- මධ්‍යම අප්‍රිකානු රටවල්
- ඕස්ට්‍රේලියාව

**(නිවැරදි ව රටවල් දෙකක් නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)**

**(ii). මෙම සිතියමෙහි A, B හා C ලෙස නම් කර ඇති භූමිකම්පා කලාප නම් කරන්න. (ලකුණු 03 යි)**

- A- නැගෙනහිර අප්‍රිකානු සුවිභේද නිම්න කලාපය
- B - මධ්‍ය අත්ලාන්තික් සාගරික වැටි කලාපය
- C - මධ්‍යධරණී-හිමාල කඳු කලාපය




**(නිවැරදි ව නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)**

**(iii). සුනාමි ආපදාවෙන් සිදු වන හානි අවම කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 05 යි)**

- වෙරළට ඉතා සමීප ඉදිකිරීම් සීමා කිරීම
- වෙරළ ආශ්‍රිත ව ඇති ස්වාභාවික පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම
- සුනාමි අනතුරු ඇඟවීම් පද්ධති ස්ථාපිත කිරීම හා ප්‍රජාව දැනුවත් කිරීම
- සුනාමි අනතුරු ඇඟවීම් ලද විගස වෙරළ සමීපයෙන් ඉවත් වී උස් බිම් කරා යාම
- ආසන්න ප්‍රදේශයක උස් බිම් නොමැති නම් සවි ගැන්වූ කොන්ක්‍රීට්වලින් නිර්මිත ශක්තිමත් උස් ගොඩනැගිල්ලක ඉහළ මාලයට යාම
- ජනමාධ්‍යයට සවන් දීම
- සුනාමි නිල අනතුරු ඇඟවීම්වලට ඇහුම්කන් දීම
- සාගරය ආසන්නයේ භූමිකම්පාවක හඬක් ඇසුණේ නම් හෝ ඒ පිළිබඳ ව දැනුවත් වී නම් සුනාමි අනතුරු හැඟවීම් ලැබෙන තෙක් නො සිට මුහුදු වෙරළෙන් ඉවත් වීම
- සුනාමි අවදානම් කලාප සිතියම් ගත කිරීම හා ජනතාව දැනුවත් කිරීම
- කඩොලාන හා වෙරළබඩ වෘක්ෂලතා ආරක්ෂා කිරීම හා වගා කිරීම
- පාසල් හා ප්‍රජා මට්ටමින් සුනාමි හදිසි අභ්‍යාස පැවැත්වීම
- රජයේ ආයතන, ආපදා කළමනාකරණ අංශ සහ ප්‍රජාව අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම
- හදිසි ආපදා උපකරණ හා ආහාර/ජල සංචිත සූදානම් කර තැබීම
- ඉක්මන් ඉවත් වීම සඳහා මාර්ග හා ආරක්ෂිත ස්ථාන සකස් කිරීම
- ජන කතා, කවි, කතන්දර ආදිය මගින් කුඩා කළ සිට ම ප්‍රජාව තුළ දැනුවත් භාවය ඇති කිරීම

**(යනාදි ක්‍රියාමාර්ග තුනක් දක්වා ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03**
**විස්තරයට ලකුණු 02**
**ලකුණු 05 යි)**

Past Papers Wiki



**05. (i). පහත සඳහන් අධිවේගී මාර්ග කොටස් හඳුන්වනු ලබන්නේ කුමන නම්වලින් ද? (ලකුණු 02 යි)**

(a). මීරිගම - කුරුණෑගල : මධ්‍යම අධිවේගී මාර්ගය

(b). කොට්ටාව - ගාල්ල : දක්ෂිණ අධිවේගී මාර්ගය

**(නිවැරදි ව නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)**

**(ii). ශ්‍රී ලංකාවෙ ඇති ජාත්‍යන්තර ගුවන් තොටුපලවල් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)**

- කටුනායක
- රත්මලාන
- මත්තල
- පලාලි

**(මින් තුනක් නිවැරදි ව නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)**

**(iii). ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)**

- පාසල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
- ගුරු පුහුණුව හා ගුරු වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීම
- නව විෂය නිර්දේශ හා ඉගෙනුම් ක්‍රම හඳුන්වා දීම
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අධ්‍යාපනයට යොදා ගැනීම
- නොමිලේ පෙළපොත් හා පාසල් නිල ඇඳුම් ලබා දීම
- පාසල් පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම හා විශ්වවිද්‍යාල පහසුකම් වැඩිදියුණු කිරීම
- වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම
- ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවල පාසල් සඳහා වැඩි පහසුකම් ලබා දීම
- පාසල් සිසුන් සඳහා ප්‍රවාහන පහසුකම් හා වෙනත් සහන සැලසීම
- විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත (STEM) අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම
- දුරස්ථ හා මාර්ග ගත අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීම.
- විදුහල්පති හා ගුරු පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීම් සිදු කිරීම
- සියලු දරුවන්ට සමාන අධ්‍යාපන අවස්ථා ලබා දීමට කටයුතු කිරීම
- නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ / මොඩියුල පාදක ඉගැන්වීම් ක්‍රම හඳුන්වා දීම

**(යනාදි ක්‍රියාමාර්ග තුනක් දක්වා ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03**
**උදාහරණ සහිත ව විස්තර කර ඇත්නම් ලකුණු 02**
**ලකුණු 05 යි)**

**06. (i).** **ජපානය හැරුණු කොට මෝටර් රථ නිෂ්පාදනයේ ශීඝ්‍ර දියුණුවක් ලබා ඇති වෙනත් ආසියාතික රටවල් දෙකක් නම් කරන්න.** **(ලකුණු 02 යි)**

- චීනය
- දකුණු කොරියාව
- ඉන්දියාව
- තායිලන්තය

**(නිවැරදි ව රටවල් දෙකක් නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)**

**(ii).** **මෝටර් රථ කර්මාන්තයේ ශීඝ්‍ර දියුණුවට හේතු වූ කරුණු තුනක් සඳහන් කරන්න.** **(ලකුණු 03 යි)**

- නිෂ්පාදන සඳහා රොබෝ යන්ත්‍ර යොද ගැනීම
- ස්වයංක්‍රීය යන්ත්‍ර භාවිතය
- යාන්ත්‍රික ශ්‍රමය බහුල ව යොදා ගැනීම
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ප්‍රචලිත වීම

**(යනාදී කරුණු තුනක් සඳහන් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)**

**(iii).** **වර්තමානයේ මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ දක්නට ලැබෙන ප්‍රවණතා තුනක් පැහැදිලි කරන්න.** **(ලකුණු 05 යි)**

- විදුලි මෝටර් රථ (EV) නිෂ්පාදනය වැඩි වීම
- බැටරි තාක්ෂණය දියුණු කිරීම හා දිගු දුරක් ධාවනය කළ හැකි බැටරි නිපදවීම
- පරිසර හිතකාමී හා අඩු විමෝචන වාහන නිෂ්පාදනයට වැඩි අවධානයක් යොමු කිරීම
- කෘත්‍රිම බුද්ධිය (AI) හා ස්වයංක්‍රීය තාක්ෂණය වාහනවලට එක් කිරීම
- සම්බන්ධිත වාහන (Connected Cars) සහ අන්තර්ජාල පහසුකම් සහිත වාහන නිෂ්පාදනය
- උසස් ආරක්ෂක තාක්ෂණ - ස්වයංක්‍රීය හදිසි තිරිංග, මං තීරු අනතුරු ඇඟවීම් වැනි පහසුකම් වැඩි වීම
- රොබෝ තාක්ෂණය හා ස්වයංක්‍රීය කරණය මගින් නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි කිරීම
- ඩිජිටල් තාක්ෂණය හා මෘදුකාංග මත පදනම් වූ වාහන නිෂ්පාදනය වැඩි වීම
- ප්‍රතිචක්‍රීකරණය කළ හැකි හා සැහැල්ලු ද්‍රව්‍ය භාවිතය වැඩි වීම
- ස්වයංක්‍රීය ධාවන තාක්ෂණය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධනය වැඩි වීම
- හයිබ්‍රිඩ් හා ප්ලග්-ඉන් හයිබ්‍රිඩ් වාහන නිෂ්පාදනය පුළුල් වීම
- ස්මාර්ට් කර්මාන්තශාලා (Smart Factories) සහ දත්ත මත පදනම් වූ නිෂ්පාදන ක්‍රම භාවිතය වැඩි වීම

**(යනාදි ප්‍රවණතා තුනක් නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03**
**පැහැදිලි කිරීමට ලකුණු 02**
**ලකුණු 05 යි)**

**07. (i). කිරිපට්ටි පාලනයේ යෙදෙන (a). යුරෝපා රටක්, (b). ආසියාතික රටක් බැගින් නම් කරන්න. (ලකුණු 02 යි)**

(a). ඩෙන්මාර්කය / රුසියාව / ඔස්ට්‍රියාව
(b). ඉන්දියාව / පාකිස්ථානය / චීනය

**(නිවැරදි ව රටවල් දෙකක් නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)**

**(ii). කිරිපට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03 යි)**

- ලෝකයේ සංවර්ධිත රටවල් ව්‍යාපාරික කිරිපට්ටි පාලනයේ සියලු අංශයන්හි ප්‍රමුඛත්වය ලබාගෙන සිටීම
- කිරි ආශ්‍රිත වෙළෙඳපොළ සංවර්ධිත රටවල් විසින් පාලනය කිරීම
- කිරි ලබාගැනීම, ප්‍රවාහනය හා ගබඩා කිරීමේ දී මෙන් ම ලබාගන්නා කිරි ප්‍රමාණය වැඩි කිරීමට ද දියුණු ශිල්ප ක්‍රම භාවිත කිරීම
  නිදසුන්:- කිරිදෙනුන්ට හෝමෝන එන්නත් කිරීම, ජාන තාක්ෂණය මගින් වැඩියෙන් කිරි ලබාගත හැකි දෙනුන් බෝ කිරීම
- දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් වීම
- චීස්, බටර්, යෝගට් වැනි කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය වැඩි වීම

**(ලක්ෂණ තුනක් නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)**

**(iii). ශ්‍රී ලංකාවේ දේශීය කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර, ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)**

- දේශීය කිරි ගවයන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- වැඩි කිරි ලබා දෙන ගව වර්ග හඳුන්වා දීම හා අභිජනනය ප්‍රවර්ධනය කිරීම
- ගව ආහාර හා තෘණ වගාව සංවර්ධනය කිරීම
- පශු වෛද්‍ය හා සත්ත්ව සෞඛ්‍ය සේවා පුළුල් කිරීම
- කිරි ගොවීන් සඳහා පුහුණු හා තාක්ෂණික උපදේශන සේවා ලබා දීම
- කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන හා ශීත දාම පහසුකම් වැඩිදියුණු කිරීම
- කිරි සැකසුම් කර්මාන්ත හා කිරි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම
- කිරි ගොවීන්ට ණය, සහනාධාර හා අවශ්‍ය උපකරණ ලබා දීම
- යෝගට්, චීස්, බටර්, කිරි පිටි වැනි අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම
- දේශීය කිරි නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම
- කිරි නිෂ්පාදනය හා සැකසීම සම්බන්ධ පර්යේෂණ හා නව තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම
- ආනයනික කිරි නිෂ්පාදන මත ඇති යැපීම අඩු කර දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**(යනාදි රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් දැක්වීමට ලකුණු 01 බැගින් - ලකුණු 03**
**ඉන් එකක් විස්තර කිරීමට ලකුණු 02**
**ලකුණු 05 යි)**



Past Papers Wiki

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**08. (i). ජල චක්‍රය තුළ දක්නට ලැබෙන ක්‍රියාවලි දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)**

- වාෂ්පීකරණය
- උත්ස්වේදනය
- ඝනීභවනය
- වර්ෂණය
- අපධාවය/මතුපිට ගලා යාම
- කාන්දු වීම

**(යනාදී ක්‍රියාවලි දෙකක් නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)**

**(ii). වායුගෝලය දූෂණය වීමෙන් මානුෂ පරිසරයට ඇතිවන බලපෑම් තුනක් දක්වන්න. (ලකුණු 03 යි)**

- ශ්වසන රෝග ඇතිවීම හා වැඩි වීම
- හෘද හා රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝග ඇති වීම
- ඇස් හා සමේ ආසාදන ඇති වීම
- මිනිසුන්ගේ සෞඛ්‍ය හා මානසික යහපැවැත්මට අහිතකර බලපෑම් ඇති වීම
- ගෝලීය උණුසුම ඉහළ යාම හා දේශගුණික විපර්යාස ඇති වීම
- අම්ල වැසි ඇති වීම, එමඟින් ගොඩනැගිලි හා භෝගවලට හානි වීම
- දෘශ්‍යතාව අඩු වීම හා ධූමිකා (Smog) ඇතිවීම
- භෝග හා වෘක්ෂලතාවල වර්ධනයට බාධා වීම
- සතුන් හා ශාකවල ජෛව විවිධත්වයට බලපෑම් ඇති වීම
- ජලය හා පස දූෂණය වීම
- ගොඩනැගිලි, ස්මාරක හා යටිතල පහසුකම් හායනය වීම
- ළමුන් හා වැඩිහිටියන් වැනි සංවේදී කණ්ඩායම්වල සෞඛ්‍ය අවදානම ඉහළ යාම

**(යනාදී මානුෂ පරිසරයට ඇතිවන බලපෑම් තුනක් දැක්වීමට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)**

**(iii). ජෛවගෝලයේ පැවැත්ම කෙරෙහි බලපාන මානුෂ ක්‍රියාකාරකම් තුනක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 05 යි)**

- වනාන්තර විනාශ කිරීම
- කර්මාන්ත හා කර්මාන්තශාලා පවත්වා ගෙන යාම
- වාහන භාවිතය හා ඉන්ධන දහනය
- ඛනිජ සම්පත් කැණීම හා උපයෝජනය
- කෘෂිකර්මාන්තයේ දී රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය
- නාගරීකරණය හා ජනාවාස ව්‍යාප්ත කිරීම
- මාර්ග, ගොඩනැගිලි හා අනෙකුත් යටිතල පහසුකම් ඉදිකිරීම
- අධික ලෙස මත්ස්‍ය හා වනජීවී සම්පත් ලබාගැනීම
- අපද්‍රව්‍ය පරිසරයට බැහැර කිරීම
- ජල මූලාශ්‍ර දූෂණය කිරීම
- හරිතාගාර වායු විමෝචනය වැඩි කිරීම
- මුහුදු හා වෙරළබඩ පරිසර පද්ධති විනාශ කිරීම
- ගිනි තැබීම් හා අනවශ්‍ය ලෙස ඉන්ධන දහනය කිරීම
- ආක්‍රමණශීලී ජීවී විශේෂ හඳුන්වා දීම

**(යනාදී මානුෂ ක්‍රියාකාරකම් තුනක් දැක්වීමට ලකුණු 01 බැගින් - ලකුණු 03**
**උදාහරණ සහිත විස්තරයට ලකුණු 02**
**ලකුණු 05 යි)**

****

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library